සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 25A - ඉන්දියානු ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

## 25A - ඉන්දියානු ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | = 01 x 40 | = | 40 |
| II පත්‍රය | | | |
| | අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| | සෙසු ප්‍රශ්න 3 කට 14 බැගින් | = | 42 |
| | II පත්‍රය අවසාන ලකුණු | = | 60 |
| | අවසාන ලකුණු | = | 40 + 60 = 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................
............................................ √ △ $\frac{4}{5}$
............................................

(ii) ............................................
............................................ √ △ $\frac{3}{5}$
............................................

(iii) ............................................
............................................ √ △ $\frac{3}{5}$
............................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

**25 - A S II**

2018.08.23 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**විභාග අංකය:** ....................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

* අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) හින්දුකුෂ් (2) සුලෙයිමාන් (3) නිල්ගිරි (4) කිර්තාර් (5) හිමාලයා (......)

2. (1) සොග්‍රා (2) ජේලම් (3) චෙනබ් (4) බියස් (5) රාවි (......)

3. (1) ශාකුන්තල (2) මාලවිකාග්නිමිත්‍ර (3) වික්‍රමෝර්වශී (4) රත්නාවලී (5) කුමාරසම්භව (......)

4. (1) මස්කි ලිපිය (2) ගිරිනාර් ලිපිය (3) රුම්න්දෙයි ලිපිය (4) කෞශම්බි ලිපිය (5) නාසික් ලිපිය (......)

5. (1) ස්ට්‍රාබෝ (2) මෙගස්තිනිස් (3) සෙලියුකස් නිකේටර් (4) ප්ලිනි (5) ටොලමි (......)

6. (1) දෙමළ (2) කණ්ණඩ (3) මරාඨී (4) තෙලිඟු (5) මලයාලම් (......)

7. (1) කාර්ලේ (2) ඇල්ලෝරා (3) අජන්තා (4) භාග් (5) සාරානාත් (......)

8. (1) අනු (2) යදු (3) තුර්වාස (4) සුදාස් (5) පුරු (......)

9. (1) කාසි (2) කෝසල (3) අංග (4) මගධ (5) වජ්ජි (......)

10. (1) සිමුක (2) කෘෂ්ණ (3) නහපාන (4) පළමුවන සාතකර්ණි (5) ගෞතමිපුත්‍ර සාතකර්ණි (......)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) වරුණ - ආකාශයට අධිපති
(2) අග්නි - ගින්නට අධිපති
(3) පෘථිවි - පොළොවට අධිපති
(4) ඉන්ද්‍ර - සත්ව වර්ගයාට අධිපති
(5) උෂා - උදයට අධිපති දෙවඟන (.........)

**12.** (1) පාණිනි - අෂ්ටාධ්‍යාය
(2) වාල්මීකි - රාමායනය
(3) භාරවි - කිරාතාර්ජුන
(4) දන්ඩින් - දශකුමාර චරිතය
(5) පතංජලී - පංචතන්ත්‍රය (.........)

**13.** (1) වරංගල් - කාකතීය
(2) ද්වාරසමුද්‍ර - හොයිසාල
(3) මදුරෙයි - චෝල
(4) දේවගිරි - යාදව
(5) කාංචි - පල්ලව (.........)

**14.** (1) අයිහෝලේ සෙල්ලිපිය - දෙවන පුලකේෂින්
(2) ධෞලි සෙල්ලිපිය - සමුද්‍රගුප්ත
(3) ජුනාගර්ඩ් සෙල්ලිපිය - රුද්‍රදාමන්
(4) හිටරි සෙල්ලිපිය - දෙවන චන්ද්‍රගුප්ත
(5) දිල්ලි තෝප්‍රා ලිපිය - අශෝක (.........)

**15.** (1) මදුරෙයි කොණ්ඩ - පළමුවන පරන්තක
(2) අමිත්‍රඝාත - බින්දුසාර
(3) සකල උත්තරාපථ නාථ - හර්ෂවර්ධන
(4) කවිරාජ් - කනිෂ්ක
(5) වාතාපිකොණ්ඩ - නරසිංහවර්මන් (.........)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ක්‍රි.පූ. 327 | A | I වන රාජේන්ද්‍ර චෝළ රජවීම |
| (ii) | ක්‍රි.පූ. 269 | B | ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණය |
| (iii) | ක්‍රි.ව. 78 | C | හර්ෂවර්ධන රජවීම |
| (iv) | ක්‍රි.ව. 606 | D | කනිෂ්ක රජවීම |
| (v) | ක්‍රි.ව. 1016 | E | අශෝක රජවීම |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | නර්මදා | A | රූපාර් |
| (ii) | කාවේරි | B | පාටලීපුත්‍ර |
| (iii) | ගංගා | C | තංජෝර් |
| (iv) | සත්ලෙජ් | D | හරප්පා |
| (v) | රාවි | E | භාරුකච්ඡ |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

| | X | | Y |
|---|---|---|---|
| **18.** (i) | අශ්වඝෝෂ | A | බෘහද්සංහිතා |
| (ii) | කල්හන | B | මහාවිභාෂශාස්ත්‍ර |
| (iii) | පළමුවන මහේන්ද්‍රවර්මන් | C | මුද්‍රාරාක්ෂ |
| (iv) | විශාඛදත්ත | D | මත්තවිලාශප්‍රහසන |
| (v) | වරාහමිහිර | E | රාජතරංගිණී |

(1) ADCBE　(2) BEDCA　(3) CAEDB　(4) DBAEC　(5) ECBAD

(.........)

| | X | | Y |
|---|---|---|---|
| **19.** (i) | භාගදූග | A | බදු |
| (ii) | ශුල්ක | B | භාණ්ඩාගාරික |
| (iii) | පුර | C | බදු එකතු කරන්නා |
| (iv) | සූත | D | රථාචාර්ය |
| (v) | සංගෘහිත | E | බලකොටුව |

(1) ADCBE　(2) BEDCA　(3) CAEDB　(4) DBAEC　(5) ECBAD

(.........)

| | X | | Y |
|---|---|---|---|
| **20.** (i) | මවුස් | A | පල්ලව |
| (ii) | අග්නිමිත්‍ර | B | සුංග |
| (iii) | විෂ්ණුගෝප | C | පාල |
| (iv) | වත්සරාජ | D | ශක |
| (v) | ආනන්දපාල | E | ප්‍රතිහාර |

(1) ADCBE　(2) BEDCA　(3) CAEDB　(4) DBAEC　(5) ECBAD

(.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. පැරණි ධාන්‍යාගාරයක නටබුන් සොයාගත් ඉන්දුනිම්න නගරය කුමක් ද?**

(1) මොහෙන්ජෝදාරෝ　(2) හරප්පා　(3) කලිබංගන්
(4) ලෝතාල්　(5) චන්හුදාරො

(.........)

**22. මහායාන ග්‍රන්ථ වැඩි වශයෙන් ලියැවුණේ කුමන භාෂාවෙන් ද?**

(1) පාලි　(2) සංස්කෘත　(3) මාගධී
(4) ප්‍රාකෘත　(5) හින්දි

(.........)

**23. නාග වංශික කුමාරිකාවක් වූ කුබේරනාගා විවාහ කරගත් ගුප්ත රජු කවරෙක් ද?**

(1) පළමුවන චන්ද්‍රගුප්ත　(2) සමුද්‍රගුප්ත　(3) ස්කන්ධගුප්ත
(4) කුමාරගුප්ත　(5) දෙවන චන්ද්‍රගුප්ත

(.........)

**24. හියුං සාං භික්ෂුව අධ්‍යාපනය ලැබුවේ කුමන බෞද්ධ අධ්‍යාපන ආයතනයේ ද?**

(1) වලභි　(2) නාලන්දා　(3) වික්‍රමශීලා
(4) තක්ෂිලා　(5) ඕදන්තිපුරි

(.........)

**25. ක්‍රි.ව. 712 දී සින්ධ් ආක්‍රමණය කළ මුල්ම අරාබි ආක්‍රමණිකයා කවරෙක් ද?**

(1) මහමුද් බින් ක්වාසිම්　(2) ඝස්නි මහමුද්　(3) ඝෝර්හි මහමුද්
(4) කුටුබ්-උද්දීන් අයිබෙක්　(5) සබුක්තිජින්

(.........)

● අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයක ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**26. ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණ**

(1) ආකිමීනියානු රජෙකු වූ ඩේරියස් පරාජය කිරීමෙන් අනතුරුව ඇලෙක්සැන්ඩර් හින්දුකුෂ් හරහා ඉන්දියාවට ඇතුළු විය.
(2) ඔහු ගංගානම් නදිය දක්වා වූ වයඹදිග ඉන්දියානු රාජ්‍ය සියල්ලම යටත් කිරීමට සමත් විය.
(3) ඇලෙක්සැන්ඩර් ඉන්දියාව ආක්‍රමණය කළේ මගධයේ නන්දයන්ගේ රජ දවසේ දී ය.
(4) ඔහුගේ ආක්‍රමණය හේතු කොට ගෙන ඉන්දියාව හා බටහිර ලෝකය අතර නිදහස් සබඳතා ආරම්භ විය.
(5) ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දියානු ආක්‍රමණය පිළිබඳ ව ඉන්දියානු සාහිත්‍ය ග්‍රන්ථවල කිසිම සඳහනක් නොමැත.

(.........)

**27. ඛාරවේල**

(1) ඛාරවේල කාලිංගයේ චේදි වංශයේ තුන්වන රජු ය.
(2) ඛාරවේල ක්‍රි. පූ. පළමුවන සියවසේ දී කාලිංගය පාලනය කළැයි විශ්වාස කෙරේ.
(3) ඔහු දැඩි ජෛන භක්තිකයෙකු විය.
(4) ඔහුගේ කාර්යසාඵල්‍යය ගැන උදයගිරි කඳුවල පිහිටි හතිගුම්පා සෙල්ලිපියෙහි විස්තර කෙරේ.
(5) ඔහුගේ මරණයෙන් පසු රාජධානිය පාණ්ඩ්‍යයන් විසින් යටත් කර ගන්නා ලදී. (.........)

**28. ජෛනාගම**

(1) ව්‍රත නමින් හැඳින්වූ ප්‍රධාන ශික්ෂා පද පහක් ජෛනයන් විසින් අනුගමනය කර ඇත.
(2) ජෛනාගමේ පළමුවන තීර්තංකර මහාවීරයි.
(3) භාවනාව අවශ්‍යයෙන් ම ප්‍රගුණ කළ යුතු එකක් ලෙස ජෛනයෝ ද සලකති.
(4) දිගම්බර හා ස්වේතාම්බර නම් වූ ප්‍රධාන කණ්ඩායම් දෙකකට ජෛනයෝ බෙදී සිටියහ.
(5) ජෛනයන් අනුගමනය කළ ප්‍රධාන ප්‍රතිපත්තිය වූයේ අවිහිංසාවයි. (.........)

**29. පාණ්ඩ්‍යයෝ**

(1) පාණ්ඩ්‍ය රාජ්‍යයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ කඩුන්ගෝන් ය.
(2) පාණ්ඩ්‍ය රාජ්‍යය කාන්තාවන් විසින් පාලනය කරන ලද බව මෙගස්තීනිස් සඳහන් කරයි.
(3) අශෝකගේ සෙල්ලිපිවල ඔහු විසින් පාණ්ඩ්‍ය රාජ්‍යය යටත් කර ගත් බව සඳහන් කරයි.
(4) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ශ්‍රී ලංකාවේ රජතුමා පරාජය කළ බව ඉන්දීය මූලාශ්‍රවල සඳහන් වේ.
(5) චෝල පාලක පළමුවන පරන්තකට පරාජය වූ දෙවන මාරවර්මන් රාජසිංහ රජු ලංකාවට පලා ආවේ ය.

(.........)

**30. වාතාපිහි චාලුක්‍යයෝ**

(1) පළමුවන පුලකේශීන් රජු වාතාපිය අගනුවර බවට පත් කරන ලදී.
(2) පළමුවන පුලකේශීන් අශ්වමේද හා වාජ්පේය වැනි යාග පවත්වා ඇත.
(3) පල්ලව රජකු වූ පළමුවන නරසිංහවර්මන් වාතාපි ආක්‍රමණය කොට දෙවන පුලකේශීන් මරා දැමූ බව සඳහන් වේ.
(4) දැඩි බ්‍රාහ්මණ ආගම ඇදහූවන් වූ චාලුක්‍යයෝ තම රාජ්‍යය තුළ අන්‍ය ආගම් නොඉවසූහ.
(5) සමහර බ්‍රාහ්මණාගමික සිද්ධස්ථාන පිහිටි ගලෙන් නිර්මාණය කොට ඇත. (.........)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

  **(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද
  **(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද
  **(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද
  **(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද
  ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. |

**31. වෛදික යුගය**

(A) ඍග් වේදයෙහි වින්ධ්‍යා කඳුවැටිය හා නර්මදා ගඟ ගැන සඳහන් වේ.
(B) ඍග් වෛදික ජනයා ආහාරයට ගත්තේ එළවළු වර්ග පමණි.
(C) ඍග් වෛදික ජනයා ගෝත්‍රවලට බෙදී සිටියහ.
(D) භරතයන්ගේ රජු වූ සුදාස් විසින් දස ගෝත්‍රික සංයුක්තයේ නායක වූ විශ්වමිත්‍ර පරාජය කරන ලදී.
(.........)

**32. සාතවාහනයෝ**

(A) සාතවාහන රාජවංශයේ පළමුවන රජු සිංහ විෂ්ණු ය.
(B) සාතවාහනයන්ගේ අගනුවර ප්‍රතිශ්ඨාන් විය.
(C) ගෞතමීපුත්‍ර ශාතකර්ණිගේ මව ගෞතමී බාලශ්‍රී ය.
(D) සාතවාහනයන් යටතේ හින්දු ආගම උච්ච ස්ථානයට පත්විය. (.........)

**33. ධර්මපාල**

(A) පාලවංශයේ ආරම්භකයා වූ ගෝපාලගේ පුත්‍රයා මෙන්ම අනුප්‍රාප්තිකයා වූයේ ද ධර්මපාලයි.
(B) ධර්මපාල ඕදන්තිපුර ආශ්‍රමයේ ආරම්භකයා ය.
(C) ධර්මපාලගේ කැපී පෙනෙන කාර්යය වූයේ කනෞජයේ ඉන්ද්‍රායුධ පරදා චක්‍රායුධ එහි සිහසුන්ගත කිරීම ය.
(D) දෙවන නාගභට විසින් චක්‍රායුධ කුමරු සිහසුනෙන් ඉවත් කිරීමට ගත් උත්සාහය ව්‍යර්ථ කිරීමට ධර්මපාල සමත් විය. (.........)

**34. ඉන්දියාවේ ශක පාලනය**

(A) ශකවරු ක්‍රි. පූ. 75 පමණ දී සින්ධ්හි බලය පිහිට වූහ.
(B) ශකවරු පැමිණියේ මධ්‍යම ආසියාවෙන් ය.
(C) ශක පාලනය යටතේ පැවති මථුරා සහ තක්ෂිලා උතුරු සත්‍රප ලෙස හැඳින්විණි.
(D) ශකවරු පාලනය කළ මාල්වා සහ කතියවාර් ප්‍රදේශ හඳුන්වන ලද්දේ බටහිර ක්ෂත්‍රප ලෙසිනි. (.........)

**35. ස්කන්ධගුප්ත**

(A) ස්කන්ධගුප්ත සිය පියාවූ කුමාරගුප්ත විසින් පුෂ්‍යමිත්‍රයන්ට විරුද්ධව සටනට යැවී ය.
(B) අධික වර්ෂාව නිසා බිඳීගිය සුදර්ශන ජලාශය ස්කන්ධගුප්ත විසින් පිළිසකර කරන ලදී.
(C) ඔහු දැඩි ශිව භක්තිකයකු විය.
(D) ස්කන්ධගුප්තගේ මරණයත් සමග අභ්‍යන්තර අරගල නිසා ගුප්ත අධිරාජ්‍යය බිඳ වැටුණි.
(.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | බිම්බිසාර රජු මගධයේ තම බලය තහවුරු කර ගත්තේ පාටලීපුත්‍ර අගනුවර සිට ය. | මෞර්ය අවධියේ දී පාටලීපුත්‍ර නගරයේ පාලනය මණ්ඩල හයකට පැවරී තිබුණු බව වාර්තා වේ. | (.........) |
| **37.** | අධිරාජ්‍ය ගුප්තයන්ගේ බිඳවැටීමත් සමග උතුරු ඉන්දියාවේ දේශපාලන කටයුතුවල මධ්‍යස්ථානය වූයේ කනෞජයයි. | කනෞජයේ අධිරාජ්‍යයක් පිහිටුවන ලද්දේ හර්ෂවර්ධන විසිනි. | (.........) |
| **38.** | වින්ධ්‍යාවලින් ඔබ්බට බලය ව්‍යාප්ත කළ එකම දකුණු ඉන්දියානු රාජ්‍යය චෝල අධිරාජ්‍යයි. | චෝලයන් තම බලය පිහිටුවන ලද්දේ පාණ්ඩ්‍ය රාජ්‍යයේ නටබුන් මත ය. | (.........) |
| **39.** | සීතා බේරා ගැනීම සඳහා රාමා විසින් රාවණා සමග කළ සටන රාමායනයට පදනම් වී ඇත. | රාමායනය ඉන්දියාවේ ඇති එකම වීර කාව්‍යයයි. | (.........) |
| **40.** | යශෝවර්මන් ක්‍රි. ව. අටවන සියවසේ මුල් භාගයේ දී කනෞජයේ රාජ්‍ය කළේ ය. | යශෝවර්මන් පිළිබඳ තොරතුරු ලැබෙන්නේ පාහියන් වාර්තාවලිනි. | (.........) |

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂය අංකය / பாட இலக்கம்: 25-A

විෂයය / பாடம்: ඉන්දියා ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 2 | 31. | 3 |
| 02. | 1 | 12. | 5 | 22. | 2 | 32. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 5 | 33. | 4 |
| 04. | 5 | 14. | 2/4 | 24. | 2 | 34. | 5 |
| 05. | 3 | 15. | 4 | 25. | 1 | 35. | 1 |
| 06. | 3 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 07. | 5 | 17. | 5 | 27. | 5 | 37. | 2 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 09. | 5 | 19. | 3 | 29. | 3 | 39. | 1 |
| 10. | 3 | 20. | 4 | 30. | 4 | 40. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | | | |
|---|---|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>**History II** | **25-A** | **E** |

ප්‍රශ්න අංකය / வினா இல. / **Question No.** **1**

විභාග අංකය / சுட்டெண் / **Index No.** ..............................



## ii කොටස

**1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඔබ කැමති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

| | |
|---|---|
| (i) ලෝතාල් | (ii) ආරවල්ලි |
| (iii) ඉන්ද්‍රප්‍රස්ථ | (iv) ගෝදාවරී ගඟ |
| (v) මක්‍රාන් කපොල්ල | (vi) පාටලීපුත්‍ර |
| (vii) පුරුෂපුරය | (viii) කාවේරී පටුන |

**(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)**

**2. පුරාතන ඉන්දීය ඉතිහාසය හැඩගැස්වීම කෙරෙහි භූගෝලීය ලක්ෂණ බලපෑ ආකාරය පරීක්ෂා කරන්න.**

- උපමහද්වීපයක් වූ ඉන්දියානු අර්ධද්වීපයේ ඉතිහාසය කෙරෙහි එහි භූගෝලීය පිහිටීම ප්‍රධාන සාධකය ලෙස බලපා තිබීම.
- උතුරෙන් හා ඊසාන දෙසින් පිහිටි හිමාල කඳුවැටියත් වයඹ දෙසින් පිහිටි හින්දුකුෂ්, සුලෙයිමාන්, කිර්තාර් කඳුවැටිවලිනුත් ඉන්දියාව බාහිර ලෝකයෙන් වෙන්ව පිහිටීම.
- බටහිරින් අරාබි මුහුදිනුත් දකුණින් හා නැගෙනහිරින් ඉන්දියන් සාගරයෙනුත් වටවී තිබීම.
- අභ්‍යන්තර භූගෝලීය ලක්ෂණ රැසකිः
    - කපොලු (ඛයිබර්, බෝලාන්, මක්‍රාන්, බැරෝඩා, බලසෝර්)
    - කඳු (හිමාලය, ආරවල්ලි, වින්ද්‍යා, සත්පුර, කිර්තාර්, සුලෙයිමාන්, නැගෙනහිර ඝාට්ස්, බටහිර ඝාට්ස්)
    - ගංගා (ඉන්දු ගඟ හා එහි අතුගංගා, ගෝදාවරී, ගංගා, යමුනා, නර්මදා, තප්ති, ක්‍රිෂ්ණා, තුංගභද්‍රා)
    - වරායන් (ලෝතාල්, තාම්‍රලිප්ති, භාරුකච්ඡ, සුප්පාරක, කාවේරි)
    - කාන්තාර (ථාර්)
    - සානු (ඩෙකෑන්)
    - තැනිතලා (ගංගා-යමුනා)
    - භූ සම්පත්වල බහුලත්වය

**මෙම භූගෝලීය සාධක ඉන්දියාවේ ඉතිහාසය සකස් වීම කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳව නිදසුන් සහිතව විස්තර කළ යුතුයි.**

**(ලකුණු 14 යි)**

**3. 'ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉන්දියාවේ පැරණිතම නාගරික ශිෂ්ටාචාරයයි.'**

**(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නටබුන් පළමු වරට සොයාගත් බ්‍රිතාන්‍ය ජාතිකයා නම් කරන්න.**

ඇලෙක්සැන්ඩර් කනිංහැම්

**(ලකුණු 01)**

**(ii) මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර දෙකක් නම් කරන්න.**

මොහෙන්ජොදාරෝ
හරප්පා
චන්හුදාරෝ
ලෝතාල්
කලිබංගන්
ධොලවීර
බනවාලි
රබීසාර්

**(ලකුණු 02)**

**(iii) මෙම ශිෂ්ටාචාරයේ ප්‍රභවය පිළිබඳ පවත්නා මත සැකෙවින් සාකච්ඡා කරන්න.**

➢ ප්‍රභවය පිළිබඳ ප්‍රධාන මත දෙකක් පවතී:

- දේශීය ප්‍රභවය
  ග්ලීනි ඩැනියෙල් -. බටහිර ඉන්දියාවේ ග්‍රාමීය සංස්කෘතීන්ගෙන් ප්‍රභවය වූ බව

- විදේශීය ප්‍රභවය
  එලියට් ස්මිත් - මිසර ශිෂ්ටාචාරයෙන් ප්‍රභවය වූ බව
  රෙග්ලන් සාමි - සුමේරියානු ශිස්ටාචාරයෙන් ප්‍රභවය වූ ශාඛා ශිෂ්ටාචාරයක් බව
  සර් මෝටිමර් වීලර් - මධ්‍ය ආසියාවෙන් ප්‍රභවය වූ ශිෂ්ටාචාරයක් බව

**(ලකුණු 04)**

**(iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නාගරික ලක්ෂණ විචාරාත්මකව පරීක්ෂා කරන්න.**

➢ ඇතුළු නගරය හා පහළ නගරය ලෙස නගරය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වීම.
➢ ඇතුළු නුවර උස් වේදිකාවක් මත ඉදිකර තිබීම - පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීම.
➢ පිටත නුවර ජනතාව ජීවත් වූ ප්‍රදේශය වීම.
➢ ක්‍රමානුකූල, සැලසුම්සහගත නගර නිර්මාණය.
➢ අලංකාරයට වඩා උපයෝගිතාවට ප්‍රමුඛස්ථානයක් ලබාදීම.
➢ බලකොටු ස්වරූපයෙන් දක්නට ලැබීම.
➢ නගරය වටා මුර අට්ටාල සහිත ප්‍රාකාර ඉදිකර තිබීම.
➢ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රධාන වශයෙන් ගඩොල් උපයෝගි කර ගැනීම (පිළිස්සූ ගඩොල් සහ හිරු එළියෙන් වේලන ලද ගඩොල් භාවිත කිරීම).
➢ පැතලි වහල, ලම්බාකාර බිත්ති, සුවිසල් කුලුනු සහිත ශාලා, ජල තටාක, ධාන්‍යාගාර.
➢ කුඩා තනි කාමර හෝ කාමර දෙකකින් යුත්, පටු මාවත් දෙපස ඉදි වූ නිවාසවල සිට, පුළුල් මාවත් දෙපස ප්‍රමාණයෙන් විශාල කාමර සහ සංඛ්‍යාත්මකව වැඩි ප්‍රමාණයෙන් යුත් කාමරවලින් යුත් නිවාස සංකීර්ණ දක්නට ලැබීම.
➢ දියුණු සෞඛ්‍ය හා සනීපාරක්ෂක ක්‍රම භාවිත කිරීම.
➢ වීදි දෙපස ඇති ගොඩනැගිලිවල ප්‍රවේශ දොරටු, ප්‍රධාන වීදියට නොව, අතුරුවීදිවලට මුහුණලා නිර්මාණය කිරීම.
➢ බොහෝ නිවාසවල මැද මිදුල් දක්නට ලැබීම, වාතාශ්‍රය සහ ඉඩකඩ සහිත නිවාස.
➢ සමාජයේ විවිධ ජන කොට්ඨාශ හා විවිධ වෘත්තිකයන් සඳහා ද නිවාස වෙන් කොට තිබීම.
➢ විශිෂ්ට ජලාපවාහන ක්‍රමය
➢ හදිසි ජලගැලීම්වලින් ආරක්ෂා වීමට කාණු පද්ධති සකස් කර තිබීම.
➢ අපවිත්‍ර ජලය පමණක් කාණුවලට යොමු කිරීම.

- ➢ කාණු, ගල් පුවරුවලින් වසා තැබීම, පිරික්සුම් කවුළුවලින් යුක්ත වීම.
- ➢ සැලසුම්සහගත, රේඛානුකූල, දැල් රටාවක ස්වරූපයට විහිදුනු මාර්ග පද්ධතියහ ා වීථි පහන්.
- ➢ සමාජ ස්තරායනය
    - නාගරික ප්‍රභූ පන්තිය
    - සුඛෝපභෝගී ජීවිත ගත කළ නාගරික ජනතාව
    - ධනවත් වෙළඳ පන්තිය
    - කම්කරු පන්තිය
- ➢ මනා පාලන සංවිධානයක් පැවතීම.
- ➢ දේශීය හා විදේශීය වෙළඳාම.
- ➢ ලේඛනය

**(ලකුණු 07)**

**4. ක්‍රි.පූ. හයවන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති දේශපාලන තත්ත්වය පැහැදිලි කරන්න.**

ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය පිළිබඳව තොරතුරු බෞද්ධ, ජෛන හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල සඳහන්ව තිබීම.

- ➢ ග්‍රාමීය ගෝත්‍රිකත්වයෙන් මිදී ජනපද තත්ත්වය කරා ළඟාවීමෙන් ජනපද 16ක් ඇතිවීම (ඒවා සොළොස් මහා ජනපද ලෙස හැඳින්වීම).
- ➢ බෞද්ධ මූලාශ්‍රයක් වන අංගුත්තර නිකායේ ජනපද 16ක් පැවති බව සඳහන් වීම.

උදා: අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේදි, වත්ස්‍ය, මත්ස්‍ය, පංචාල, කුරු, සූරසේන, අස්මක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ වශයෙන් දක්වා තිබීම.

- ➢ සොළොස්මහා ජනපද තුළ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම දෙකක් හඳුනාගෙන තිබේ.
    - රාජාණ්ඩු පාලන ක්‍රමය
    - සමූහාණ්ඩු පාලන ක්‍රමය

**<u>රාජාණ්ඩු පාලනයේ ලක්ෂණ</u>**

- සොළොස් මහා ජනපද අතරින් ප්‍රධාන රාජාණ්ඩු 4ක් දැකිය හැකිය . මගධ, කෝසල, වත්ස, අවන්ති (මේවා චතුර් මහා විජිතයන් ලෙස ද හැඳින්වේ).
- රාජාණ්ඩු පාලනයේ රජු ප්‍රධානියා විය.
- ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන අංශ රජුට සීමා වීම.
- නමුත් මන්ත්‍රී පර්ෂදය මගින් රජුගේ බලය සීමා විය.
- ඇත්, අස්, රිය, පාබල යන අංශවලින් යුක්ත හමුදාවක් සිටීම.
- මත්ස්‍ය න්‍යාය හා විවාහ සබඳතා භාවිත කරමින් ප්‍රධාන රාජ්‍ය 4 විසින් අනෙක් රාජ්‍ය යටත් කරගනු ලැබීම.
- අවසානයේ මගධය සියලු රාජ්‍ය අභිබවමින් ඉදිරියට පැමිණීම.
- එයට මගධයේ භූගෝලීය සාධකවල බලපෑම ඉවහල් වීම.
- සොළොස්මහා ජනපදවලින් බහුතරයක පැවතියේ රාජාණ්ඩු වීම.

**<u>සමූහාණ්ඩු පාලනය (සංඝ රාජ්‍ය පාලනය)</u>**

- ➢ සමූහාණ්ඩු පාලනය අතරින් වජ්ජි- හා මල්ල ජනපද කැපී පෙනෙන සමූහාණ්ඩු වේ.
- ➢ බෞද්ධ සාහිත්‍යයේ සංඝ රාජ්‍යය 9 ක් ගැන සඳහන් වේ.
    - කපිලවස්තුවේ ශාක්‍යයන්
    - වෛශාලියේ ලිච්ඡවීන්
    - මිථිලාවේ විදේහයන්
    - රාමග්‍රාමයේ කෝලියවරුන්
    - කුසිනාරාහි හා පාවාහි මල්ලයන්
    - අල්ලකප්පයේ බූලිවරු

- කේසපුත්තයේ කාලාමයන්
- පිප්ඵලිවනයේ මෝරියවරුන්
- සුංසුමාගිරියේ භග්ගයන්

- ➢ මේවායේ රාජ්‍ය ප්‍රධානීන් සණපති, සණ ජ්‍යෙෂ්ඨ හා සණ රාජන් යන නම්වලින් හැඳින් වේ.
- ➢ සමූහාණ්ඩුවල පාලනය නියෝජිතයන් රැසකගෙන් සැදුම්ලත් විධායක සභාවක් මගින් සිදුවිය.
- ➢ ලිච්ඡවී සමූහාණ්ඩුවේ රජවරු 7707 ක් සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
- ➢ ලිච්ඡවීන් ඒකරාශි වූ ස්ථානය සන්ථාගාර ශාලාව ලෙස හැඳින් වේ.
- ➢ දඬුවම් ලබාදීම 'ප්‍රවේනි පුස්තකයට' අනුව සිදුවිය.
- ➢ රාජ්‍ය පාලන කටයුතු සඳහා සප්ත අපරිහානි ධර්ම ගුරු කොට ගනු ලැබීය.
- ➢ බුදුරජාණන් වහන්සේ පවා වජ්ජි රාජ්‍යයේ පැවති සප්ත අපරිහානි ධර්ම අගය කළහ.
- ➢ සණ රාජ්‍ය මුලිනුපුටා දැමීම චන්ද්‍රගුප්ත මෞර්ය රාජ්‍ය සමයේ සිදු විය.

**(ලකුණු 14)**

**5. 'මෞර්ය අධිරාජ්‍යය පිහිටුවීමේ ගෞරවය චන්ද්‍රගුප්ත මෞර්ය රජුට හිමිවේ'. මෙම කියමන සාකච්ඡා කරන්න.**

- ➢ මෞර්ය අධිරාජ්‍යයේ ආරම්භකයා හා ඉන්දීය ඉතිහාසයේ ප්‍රථම අධිරාජයා වීම.
- ➢ චානක්‍ය (කෞටිල්‍ය) බමුණාගේ සහායෙන් නන්ද බලය අවසන් කිරීම.
- ➢ වයඹදිග ඉන්දියාව ග්‍රීක බලයෙන් මුදවා ගැනීම. දෙපක්ෂය අතර ගිවිසුමක් ඇති වීම හා ඉන් චන්ද්‍රගුප්ත මෞර්යගේ රාජ්‍යය වයඹ දිගින් විශාල වීම.
- ➢ සෙලියුකස් නිකේටර් සමග සටන සිදුවීම හා චන්ද්‍රගුප්ත මෞර්ය අතර ගිවිසුමක් ඇති වීම.
- ➢ එමගින් කාබුල්, ඒරියා, කන්දහාර් හා බලුකිස්ථාන් යන ප්‍රදේශ ලැබීම හා පර්සියානු මායිම දක්වා අධිරාජ්‍යය ව්‍යාප්ත වීම.
- ➢ පුහුණු කරන ලද ඇතුන් 500ක් ලැබීම, මෙගස්තිනීස් තානාපතියෙකු ලෙස එවීම, රජුගේ දියණිය චන්ද්‍රගුප්ත මෞර්ය රජුට විවාහකරදීම ආදි තොරතුරු මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථයේ සඳහන් වේ.
- ➢ අධිරාජ්‍යයේ බලය ඩෙකෑන් ප්‍රදේශය හා දකුණ දක්වා ව්‍යාප්ත වීම.
- ➢ චන්ද්‍රගුප්ත රජුගේ අවසන් කාලයේදී මයිසෝරය සමග සබඳතා පැවැත්වීම හා ශ්‍රවණබෙල්ගෝලාවේ තවුස් දිවියක් ගත කිරීම.
- ➢ ඔහුගේ රාජ්‍යයට බටහිරින් පිහිටි කතියවාර් අර්ධද්වීපයේ සුරාෂ්ට්‍රදේශය පවා අයිති වූ බව රුද්‍රදාමන්ගේ ජුනාගාද් ලිපියේ සනාථ වේ. එහි පාලකයා බවට පත්වීම හා ඔහු සුදර්ශන විල ප්‍රතිසංස්කරණය කිරීම.
- ➢ රජු විදේශ සබඳතා පැවැත්වීම.(සිරියාව,ඊජිප්තුව සමඟ තානාපති සබඳතා පැවැත්වීම).
- ➢ ගොඩබිම් හා මුහුදු මාර්ග ඔස්සේ වෙළෙඳාම පවත්වා ගෙන යෑම.
- ➢ රජු මනා පරිපාලන සංවිධානයක් ඇති කිරීම (පරිපාලන දෙපාර්තමේන්තු 28ක් පැවති බවත් දවසේ වැඩ කටයුතු සංවිධානය කළ ආකාරය, විදේශ යුද කටයුතු පිළිබඳව පුහුණුව ලැබූ කාන්තා අංගාරක්ෂක හමුදාවක් සිටීම).
- ➢ සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත කමිටු 6ක් පැවති බව සඳහන් වේ.
- ➢ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම (සුදර්ශනවිල ප්‍රතිසංස්කරණය කිරීම).
- ➢ ඉන්දියාවේ ප්‍රථම විශාලම අධිරාජ්‍යය නිර්මාණය කිරීමේ ගෞරවය මොහුට හිමි වීම.

**(ලකුණු 14)**

**6. ඉන්දියානු සංස්කෘතික අභිවර්ධනය උදෙසා කුෂාණ පාලකයින්ගේ දායකත්වය පරීක්ෂා කරන්න.**

කුෂාණයින් විදේශ ජන කණ්ඩායමක් වුවද පෙෂාවෝරය මුල්කර ගනිමින් දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම හා ආර්ථික වශයෙන් ඇති වූ දියුණුව සංස්කෘතික අභිවර්ධනයට හේතු විය.

- ➢ කනිෂ්ක රජු කුෂාණ වංශයේ ප්‍රධාන වූ අතර වශිෂ්ක හා හුවිෂ්කද සංස්කෘතික අභිවර්ධනයට අනුග්‍රහය දක් වූහ.
- ➢ කනිෂ්ක රජු මහායාන බුදුදහමේ ප්‍රගමනයට හේතු වූ සිව්වන සංගායනාව කාශ්මීරයේ කුණ්ඩලවනවිහාරයේදී වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් හා අශ්වඝෝෂ, පාර්ශව, වසුබන්දු, සූරියබන්දු, ජිනබන්දු වැනි මහතෙරුන් 500 කගේ සහභාගිත්වයෙන් පැවැත්වීම.
- ➢ සංගායනාවෙන් පසු මහාවිභාෂා නම් සංස්කෘත බසින් ත්‍රිපිටකය රචනා කිරීම ( විනය පිටකය - විනය විභාෂා; සූත්‍ර පිටකය - උපදේශ ශාස්ත්‍ර, අභිධර්ම - මහාවිභාෂා).
- ➢ මධ්‍යම හා නැගෙනහිර ආසියාතික රටවලට මහායාන ආගම ව්‍යාප්ත කිරීම (චීනය, ජපානය, කොරියාව).
- ➢ මධ්‍යාසියාවේ යාර්ඛාන්ඩ්, ඛෝටාන් හා නීය වැනි ස්ථානවල බෞද්ධ මධ්‍යස්ථාන ඇතිවීම, ඉන්දීය සංස්කෘතිය ඉන්දියාවෙන් ඔබ්බට ගමන් කිරීම.
- ➢ ඉන්දියානු භාෂා ශාස්ත්‍රීය වර්ධනයක් ඇතිවීම.
- ➢ අශ්වඝෝෂ, වසුමිත්‍ර, පාර්ශව, නාගාර්ජුන, සංඝරක්ෂිත වැනි වියත් භික්ෂූන් වහන්සේලාගේ ග්‍රන්ථකරණය නිසා බුද්ධ චරිතය, සූත්‍රාලංකාරය, ශාරිපුත්‍ර ප්‍රකරණය, සෞන්දරානන්ද කාව්‍ය වැනි ග්‍රන්ථ රැසක් බිහිවීම.
- ➢ කලාව අතින් ගාන්ධාර, මථුරා වැනි කලා සම්ප්‍රදායන් ඇතිවීම හා මානවීය බුද්ධ ප්‍රතිමාකරණය ඇතිවීම.
- ➢ අච්චු කාසි නිපදවීම, ක්‍රි. ව.78 පාදක කරගෙන ශක රාජ වර්ෂ ක්‍රමය ඇරඹීම.
- ➢ බෞද්ධ ගොඩනැගිලි ඉදි කිරීම (විහාරාරාම, ස්තූප - පේෂාවෝර් ධාතු මන්දිරය).
- ➢ වශිෂ්ක, හුවිෂ්ක රජවරුන් බුදු සසුනේ දියුණුවට කටයුතු කර ඇති අතර හියුං ත්සාං දක්වන ආකාරයට හුවිෂ්ක පුරයේ ආරාමවල භික්ෂූන් 5000ක් වැඩ වාසය කිරීම.
- ➢ කුෂාණ පාලකයන් අන්‍ය ආගම් සම්බන්ධයෙන් සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

**(ලකුණු 14)**

**7. 'සමුද්‍රගුප්ත රජුගේ යුද ප්‍රයාන, ගුප්ත අධිරාජ්‍යය පිහිටුවීම සඳහා බලපෑ ප්‍රධානම සාධකය විය.'**

**(i) සමුද්‍ර ගුප්ත රජුගේ යුද ප්‍රයාන විස්තර කෙරෙන අභිලේඛනය නම් කරන්න.**

අලහබාද් ප්‍රශස්තිය

**(ලකුණු 01)**

**(ii) සමුද්‍රගුප්ත රජුගේ ප්‍රධාන යුධ මෙහෙයුම් දෙකක් පිළිබඳ විග්‍රහ කරන්න.**

- ➢ ආර්යාවර්තය ජයගැනීම -

  රාජ්‍ය නවයක් යටත් කොට ගුප්ත රාජ්‍යයට ඈඳා ගන්නා ලදී.
  රුද්‍රදේව, මථිල, නාගදත්ත, චන්ද්‍රවර්මන්, ගණපතිනාග, නාගසේන, නන්දින්, අච්‍යුත, බාලවර්මන් යන රජවරුන් පරාජය කොට එම රජවරුන් යටතේ පැවති රාජ්‍ය ඈඳා ගැනීම

- ➢ අටවික රාජ්‍යය ජයගැනීම

  මධ්‍යම ඉන්දියාව එනම් වින්ද්‍යා කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශවල රාජ්‍යයන්හි රජවරුන් පරාජයට පත් කොට ඔවුන්ගේ යටත්භාවය පමණක් ලබා ගැනීම. නමුත් එම රාජ්‍යයන් ගුප්ත රාජ්‍යයට ඈඳා නොගැනීම.

- ➢ දක්ෂිණාපථ රාජ්‍යය ජයගැනීම

  දක්ෂිණාපථ රාජ්‍යය යටත් කොට ඒවායේ පාලකයන් අල්ලාගත් අතර ඔවුන් රජුගේ ආධිපත්‍ය පිළිගත් යටත් පාලකයන් ලෙස නැවතත් එම රාජ්‍යවල පිහිටුවීම.

  කෝසලයේ මහෙන්ද්‍ර , මහාකාන්තාරයේ ව්‍යාඝ්‍රරාජ, කෝරාලයේ මන්තරාජ, පිෂ්ටපුරයේ මහේන්ද්‍ර, කොට්ටූරයේ ස්වාමිදත්ත, එරන්දපල්ලයේ දමන,

කාංචියේ විෂ්ණුගෝප, අවමුක්තයේ නීලරාජ, වෙංගියේ හස්ථිවර්මන්, පල්ලක්කයේ උග්‍රසේන, දේවරාෂ්ට්‍රයේ කුබේර, කුෂ්තල ප්‍රදේශයේ ධනංජය.

මෙම රාජ්‍ය සියල්ලම ඩෙකානයේ නැගෙනහිර කොටසට අයත් වූ බව පෙනෙන්නට ඇත.

- ප්‍රත්‍යන්ත ප්‍රදේශ ජයගැනීම

  ගෝත්‍රික හා ප්‍රත්‍යන්ත රාජ්‍ය යටත් කරගත් අතර එම රජවරුන් විසින් බදු ගෙවීම, ගුප්ත රාජ්‍යයේ නියෝග පිළිපැදීම හා තෑගිභෝග හා විවිධ දැකුම් සමග රජු බැහැදැක යටත් බව ප්‍රකාශ කිරීම මගින් රජුගේ ආධිපත්‍යය පිළිගෙන ඇත. ප්‍රත්‍යන්ත රාජ්‍ය අතර සමතට, දවාක, කාමරූප, නේපාල, කාර්ත්‍රිපුර යන රාජ්‍ය විය. ඔහුට යටත් වූ ගෝත්‍ර අතර මාලව, අර්ජුනායන, යෞධේය, මද්‍රක, ආභීර, ප්‍රාර්ජුන, සනකානික, කාක, ධාරපරික යන රාජ්‍ය විය.

**(ලකුණු 04)**

**(iii) ගුප්ත අධිරාජ්‍යය පිහිටුවීම සඳහා සමුද්‍රගුප්ත රජුගේ යුද ප්‍රයාන මුල් වූ ආකාරය විවේචනාත්මකව පරීක්ෂා කරන්න**

- ශ්‍රී ගුප්ත විසින් පිහිටුවන ලද ගුප්ත රාජ්‍යය පළමු වන චන්ද්‍ර ගුප්ත රජුගේ ලිච්ඡවී විවාහය මගින් තරමක් වර්ධනය විය. එහෙත් පාටලීපුත්‍රයෙන් ඈත ප්‍රදේශවලට ගුප්ත බලය ව්‍යාප්ත කළේ සමුද්‍රගුප්ත රජු විසිනි. ඉහත දක් වූ අයුරු ආර්යාවර්තයේ රාජ්‍ය පාලකයන් පරාජය කොට එම ප්‍රදේශ ඍජු ගුප්ත පාලනයට නතු කර ගත් අතර ජයගත් සෙසු ප්‍රදේශවල රජවරු ගුප්ත ආධිපත්‍යය පිළිගත් පාලකයන් බවට පත් වූහ. ඊට අමතරව දේශසීමා බද පිහිටි රාජ්‍ය සමග සුහද සම්බන්ධතා පවත්වා ඇත. අලහබාද් ප්‍රශස්තියේ දක්වන අයුරු 'දෛවපුත්‍ර සාහි සහානුෂාහී සකමුරුන්ද' සහ ලංකාව දිවයින් කිහිපයක් ද ඒ අතර විය.

මෙලෙස සමුද්‍රගුප්ත විසින් පිහිටුවන ලද ගුප්ත අධිරාජ්‍යයට ඉන්පසුව දෙවන චන්ද්‍රගුප්ත සමයේදී ඈඳා ගැනුනේ මාල්වා, ගුජරාට හා සෞරාෂ්ට්‍ර යන ප්‍රදේශයි. මේ අනුව ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තියෙහිලා සමුද්‍ර ගුප්ත රජු ප්‍රමුඛස්ථානයක් ගනී.

**(ලකුණු 09)**

**8. කනෞජයේ ආධිපත්‍යය උදෙසා හර්ෂවර්ධන රජ සමයෙන් පසුව ඇති වූ අරගලය විස්තර කරන්න.**

- හර්ෂවර්ධන රජුගෙන් පසුව කනෞජයේ ආධිපත්‍යය උදෙසා ප්‍රධාන වශයෙන් රාජවංශ තුනක් අතර බල අරගල ඇති වීම. (ත්‍රිකෝණ අරගලය)
- බටහිර ඉන්දියාවේ රාජපුතානාහි ගූර්ජර ප්‍රතිහාර, බෙංගාලයේ පාල හා බටහිර ඩෙකානයේ මහාරාෂ්ට්‍රයේ රාෂ්ට්‍රකූට යන රාජ්‍ය තුන අතර ගැටීම.
- මේ රාජ්‍යයන් කනෞජයේ ආධිපත්‍යය වෙනුවෙන් යුද්ධ කරන ලද්දේ හර්ෂවර්ධන රාජ්‍ය සමයේදී උතුරු ඉන්දියාවේදි බල කේන්ද්‍රස්ථානය බවට කනෞජය පත්වීම නිසාය. කනෞජය දිනා ගැනීම උතුරු ඉන්දීය දේශපාලන ආධිපත්‍යයේ සංකේතයක් බවට පත්වී තිබීම.
- ප්‍රතිහාර පාලක වත්සරාජ, රාෂ්ට්‍රකූට පාලක ධ්‍රැව හා බෙංගාල පාලක ධර්මපාල යන රජුන් අතර ඇති වූ සටන්
- රාෂ්ට්‍රකූට පාලක ධ්‍රැව බෙංගාලය ආක්‍රමණය කොට ධර්මපාල පරාජය කළ ද ඔහුට හදිසියේ ආපසු යෑමට සිදු වීමෙන් කනෞජය අල්ලාගත් ධර්මපාල ප්‍රතිහාරයන්ට යටත්ව සිටි ඉන්ද්‍රායුධ ඉවත් කොට තමාට අවනත චක්‍රායුධ එහි පාලකයා බවට පත්කිරීම. එහිදී උතුරු ඉන්දිය පාලකයන් ධර්මපාල රජුගේ ආධිපත්‍යය පිළිගත් බව දක්නට ලැබේ.
- වත්සරාජ රජුගේ පුත් දෙවන නාගභට රජු විසින් ධර්මපාල පරාජය කිරීම, එහෙත් රාෂ්ට්‍රකූට පාලක තුන් වන ගෝවින්ද උතුරු ප්‍රදේශ ආක්‍රමණය කොට නාගභට පරාජය කිරීමට සමත් වුව ද, ගෝවින්ද රජු ආපසු යෑම නිසා ධර්මපාල රජුට වාසිදායක වීම.
- ධර්මපාල රජුගේ පුත් දේවපාල රජු ද උතුරු ඉන්දියාවේ බලය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

- ප්‍රතිහාර පාලක භෝජ ද සටන් ගෙන යමින් උතුරු ඉන්දියාවේ අධිරාජ්‍ය බලය අල්ලා ගැනීමට ක්‍රියා කිරීම.
- අවසානයේදී මෙම රාජ්‍ය තුනම දුර්වල වී ඒවායේ බලය වෙනත් කණ්ඩායම් විසින් දිනා ගැනීම.

**(ලකුණු 14)**

**9. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න**

**(A) දකුණු ඉන්දියානු සංස්කෘතියේ අභිවර්ධනයට පල්ලවයන්ගෙන් සිදු වූ දායකත්වය පරීක්ෂා කරන්න.**

- පල්ලව පාලකයන් දකුණු ඉන්දියානු සංස්කෘතියේ වර්ධනයට බොහෝ සෙයින් කටයුතු කළ අතර ඒ සඳහා පල්ලව රජුන් යටතේ ගොඩනැගුණු දේශපාලන බලය හා ආර්ථික වර්ධනය හේතුවිය.
- ඔවුන් ගොඩනැගූ සංස්කෘතික අභිවර්ධනය, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති, කැටයම්, ආගම, සාහිත්‍යය වැනි අංශ යටතේ හඳුනාගත හැකිවීම.
- ගෘහ නිර්මාණ ශිල්පයඃ
  - දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයේ ශ්‍රේෂ්ඨ අවධියක් වීම.
  - ප්‍රධාන ශෛලීන් 4 දක්නට ලැබීම.
  - මෙකල ඉදිකළ දේවාල ප්‍රධාන වශයෙන් අංශ දෙකක් යටතේ හඳුනා ගතහැකිවීම.

    1. පර්වත හාරා සකස් කළ දේවාල,
       - ✓ කුළුණු සහිත ලෙන් දේවාල ( මණ්ඩගපට්ටු, ත්‍රිචිනාපොලි, පල්ලවරම්)
       - ✓ මණ්ඩප හා රථ (මහබලිපුරම්) මහාභාරතයේ එන වීරවරුන්ගේ නම්වලින් රථ හඳුන්වා ඇත (භීම, අර්ජුන, සහදේව, ධර්මරාජ).
    2. කළුගල් භාවිතා කර ඉදිකළ දේවාල, (මාමල්ලපුරයේ හා කාංචිපුරයේ දක්නට තිබීම - කෛලාශනාථ දේවාලය, වෛයිකුණ්ඨපෙරුමාල් දේවාලය).
- මූර්ති හා කැටයම්
  - දේවාල ගෘහ තුළ, දේවාල ඇතුළත හා පිටත බිත්තිවල හින්දු දෙවි දේවතා රූප දක්නට තිබීම ( විෂ්ණු, කෘෂ්ණ, දුර්ගා, ලක්ෂ්මි).
  - හින්දු ආගමික කථා ඇසුරෙන් නිම කළ මූර්ති හා කැටයම් ( අර්ජුනගේ තපස් රැකීම හා ගංගා නදියේ අවරෝහණය, ත්‍රි මූර්තිය, සත්ව රූප, ගස්වැල්)
  - පල්ලව රජවරුන්ගේ රූප (මාමල්ලපුර කෛලාශනාථ දේවාලය)
- ආගම
  - වෛෂ්ණව අල්වාර්වරු ද ශෛව නයනාර්වරු ද ආගමික කටයුතුවල නිරත වූහ.
  - බෞද්ධ හා ජෛන ආගමික මධ්‍යස්ථාන ද දියුණු තත්ත්වයක පැවතීම. (හියුං - ත්සාංගේ දේශාටන වාර්තාවේ දැක්වෙන බව )
- අධ්‍යාපනය හා සාහිත්‍යය
  - අධ්‍යාපන හා සාහිත්‍ය කටයුතු සඳහා රාජ්‍යානුග්‍රහය ලැබීම.
  - කාංචිපුරය ප්‍රමුඛ අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්ව තිබීම (විශේෂයෙන්ම සංස්කෘත අධ්‍යයනය සම්බන්ධයෙන්).
  - පල්ලව ග්‍රන්ථ අක්ෂර( මෙහි ආභාසය ලංකාව ඇතුළු අග්නිදිග ආසියාතික රටවලට ද ලැබීම)
  - රජවරු ද සාහිත්‍යකරණයේ යෙදීම (පළමුවන මහේන්ද්‍රවර්මන් රජතුමා - මත්තවිලාශ ප්‍රහසන).

- සාහිත්‍යකරණයේ යෙදුන උගතුන් සිටීම. (රාජසභාවේ සිටි දණ්ඩීන් නම් සුප්‍රකට සංස්කෘත කවියා- දශකුමාර චරිතය, කාව්‍යාදර්ශය)
- කර්ණාටක සංගීතය බිහිවීම.
- පළමුවන මහේන්ද්‍රවර්මන් රජතුමා දක්ෂ සංගීඥයෙකුවීම.
- නාට්‍ය කලාවේ උන්නතියක් ඇතිවීම. **(ලකුණු 14)**

## (B). චෝළ පරිපාලනයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

- ➢ තන්ජෝරය මුල් කරගෙන වසර 400 පමණ පැවතුන චෝළ අධිරාජ්‍යයේ පාලන කටයුතු සුවිශේෂී ලක්‍ෂණවලින් යුක්ත විය.
- ➢ පරිපාලනය ප්‍රධාන අංශ තුනක් යටතේ සැකසුණි.

(මධ්‍ය පාලනය, ප්‍රාදේශීය පාලනය, ග්‍රාම පාලනය)

**මධ්‍ය පාලනය**

- ➢ රජු වටා සංකේන්ද්‍රගත වූ රාජාණ්ඩුක්‍රමයක් පැවතුන අතර ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ක්ෂේත්‍රවල ප්‍රධානියා රජුවීම.
- ➢ රජුට සහාය වීම සඳහා ඇමති මණ්ඩලයක් සිටීම හා රජුගේ සහායට උදන්කුට්ටම් නම් නිලධාරි මණ්ඩලයක් සිටීම (ඉහළ නිලධාරීන් පෙරුම්දනන්, පහළ නිලධාරීන් සිරුදනම්).
- ➢ මධ්‍ය පාලනයේදී එක් එක් කාර්යංශය අමාත්‍යවරයෙක් යටතේ ක්‍රියාත්මක විය. එම ප්‍රධාන කාර්යංශවලට අනුබද්ධ තවත් දෙපාර්තමේන්තු විය.
- ➢ පරිපාලනයේදී, ආඥා පාලකයා විසින් වාචිකව නිකුත් කරන ලද අතර පසුව ඒවා වාර්තා බවට පත්කොට ඇත.
- ➢ මධ්‍ය පාලනයේ ප්‍රධානියා රජු වූ අතර සහායක යුවරජු ය, උපදේශක රාජගුරු වූ අතර යුද්ධය හා සාමය සඳහා ඔහු විසින් රජුට උපදෙස් ලබාදීම.

**ප්‍රාදේශීය පාලනය**

- ➢ චෝළ රාජ්‍යයේ උච්චතම අවස්ථාවේදී රාජ්‍ය මණ්ඩලම් නම් ප්‍රධාන ඒකක 6කට බෙදා දක්වා තිබීම (චෝල මණ්ඩලම්, පාණ්ඩ්‍ය මණ්ඩලම්, මුම්මුඩිචෝල මණ්ඩලම්).
- ➢ ප්‍රධාන පාලන කොටස් (මණ්ඩල) නැවත කොට්ටම්, වලනාඩු, නාඩු, කුර්රාම්, මෙලාගම් නම් කොටස්වලට බෙදා තිබිණි.
- ➢ කන්යුර් හෙවත් කන්කුරම් නගර පාලන ඒකක විය.

**ග්‍රාම පාලනය**

- ➢ ගම්සභා පාලනය චෝල පාලනයේ විශේෂ ලක්‍ෂණයක් වීම.
- ➢ ග්‍රාම පාලනයේදී ඌර් හා නාඩු යනුවෙන් ආයතන දෙකක් විය. ගම ඌර් යනුවෙන් හැඳින් වූ අතර ඌර් කීපයක් එකතු වී මහසභා සකස් විය.
- ➢ ගමක් කෙටස් 30කට බෙදා කුසපත් ඇදීමෙන් නියෝජිතයන් තේරීම.
- ➢ උත්තරමේරූ ශිලාලිපියෙන් ග්‍රාම පාලනය පිළිබඳ තොරතුරු හමුවේ.
- ➢ ගම් පාලනය සඳහා ග්‍රාමකේය, මුක්ත, ග්‍රාම මණ්ඩල නම් වාරියම් හෙවත් කාරක සභා පැවතීම.
- ➢ ගම්සභා පාලනය කාර්යක්‍ෂම ලෙස ක්‍රියාත්මක වීම නිසා මධ්‍යම ආණ්ඩුවේ බලය දුර්වල වුවත් ගම්සභා පාලනය හොඳින් පැවතීම විශේෂ ලක්‍ෂණයකි.
- ➢ චෝළ පාලනයේ හමුදාවට ද විශේෂ තැනක් ලැබිණි. නාවික හමුදාව කැපී පෙනේ.
- ➢ චෝළ අධිරාජ්‍යය තංජෝරය මුල් කරගනිමින් සමුද්‍රාන්තර ප්‍රදේශවල ද බලය පැතිර තිබීම (ලංකාවේ උතුරු කොටස, ජාවා, සුමාත්‍රා, මාලදිවයින්, නිකොබාර් දූපත් වැනි අග්නිදිග ආසියාතික ප්‍රදේශ).

**(ලකුණු 14)**

WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!